සියලු ම හිමිකම් ඇවිරිණි

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මත්තුගම කල්විත් වලයම්

- **අංක (09) සිට (11) දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට විරුද්ධාර්ථය දෙන වචනය තෝරන්න.**

09. විදේශික
(i) ආදේශක (ii) ආයෝජන (iii) ස්වදේශික (iv) දේශික

10. සතුට
(i) ප්‍රීතිය (ii) සොම්නස (iii) නන්දනය (iv) දොම්නස

11. පුළුල්
(i) පළල් (ii) පටු (iii) අවුල් (iv) පවිටු

- **අංක (12) සිට (14) දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුරු තෝරන්න.**

12. අපි බැති ගී පුහුණු .....
(i) උනෙමු. (ii) උනෙමි (iii) විය (iv) වූයේ ය.

13. ගොවියෝ කල් යල් බලා කුඹුරු .....
(i) වපුරයි. (ii) වැපිරුවේ ය. (iii) වපුරති. (iv) වපුරන්නේ ය.

14. ..... පාරේ වැඩ නිම කළහ.
(i) කම්කරුවෝ (ii) කම්කරුවා (iii) කම්කරුවන් (iv) කම්කරු

15. පහත දී ඇති පද අතරින් උක්ත නාම පදය දක්වෙන පිළිතුර තෝරන්න.
(i) දරුවන් (ii) අප (iii) ඔවුන් (iv) ළමයි

16. පහත සඳහන් පද අතරින් අනුක්ත නාම පදය දක්වෙන පිළිතුර තෝරන්න.
(i) මිනිසුන් (ii) අපි (iii) මම (iv) ගොවියෝ

17. "කෞටිල්‍යා" යන්නෙහි නිවැරදි පිල්ලම් යෙදෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
(i) ගයනුකිත්ත, කොම්බුව, ඉස්පිල්ල, යංශය, ඇලපිල්ල
(ii) කොම්බුව, ගයනුකිත්ත, ඉස්පිල්ල, යංශය, ඇලපිල්ල
(iii) කොම්බුව, යංශය, ඇලපිල්ල, ගයනුකිත්ත, ඉස්පිල්ල
(iv) ගයනුකිත්ත, ඉස්පිල්ල, කොම්බුව, යංශය, ඇලපිල්ල

- **පහත වාක්‍යයන්හි ඇති හිස්තැන්වලට ගැළපෙන වචනය වරහනින් තෝරා ලියන්න.**

18. සැන්දෑවේ ..... (මල / මළ) හිරුගේ රැස් දහරින් හද ..... (මළ / මල) විකසිත විය.

19. පහළ ලන්දේ ..... (තන / තණ) කමින් සිටින එළදෙනගේ ..... (තණ / තන) බුරුල්ලෙන් පැටවා කිරි උරා බොයි.

20. ..... (වණය / වනය) තුළ අතරමං වූ ඇතින්න පාදයේ ..... (වනය / වණය) නිසා ඉමහත් පීඩා වින්දා ය.

LIVEWORKSHEETS